මගේ අංකය - සිආදෙ/3/5/2 –I

චක්‍රලේඛ අංක -03/2017

සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
බඹලපිටිය.

2017.02. [illegible]

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියළුම අධ්‍යක්ෂවරුන් / නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් / සහකාර අධ්‍යක්ෂවරුන්,
මූලස්ථාන මාණ්ඩලික නිලධාරී,
සියළුම බලකා අණදෙන නිලධාරීන් / පුහුණු පාසල් අණදෙන නිලධාරීන්,
සහ ව්‍යාපෘති භාර නිලධාරීන්

<u>කසළ කළමනාකරණ ජාතික වැඩසටහන</u>

උක්ත මැයෙන් යුතු ජනාධිපති ලේකමගේ අංක PCMD/PS/02/PCG හා 2017.01.03 වන දිනැති ලිපිය හා බැඳේ.

02. මානව ක්‍රියාකාරකම් හේතුවෙන් ජනනය වන කසළ එකතුවීම අවම කිරීම සඳහා දිරන කසළ සහ නොදිරන කසළ ලෙස වර්ගීකරණය කිරීම අත්‍යවශ්‍ය සහ කාලෝචිත ක්‍රියා මාර්ගයක් වන අතර එමගින් කසළ අවිධිමත් ලෙස බැහැර කිරීමෙන් ඇතිවන පාරිසරික හානිය වැළැක්වීම මෙන්ම, ඒ සඳහා දැරීමට සිදුවන පිරිවැය ද අවම කිරීමට හැකි වනු ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ සියලුම රාජ්‍ය ආයතනවල කසළ වෙන්කොට බැහැර කිරීමට පියවර ගැනීමට නියමිතය.

03. මේ සඳහා පහත සඳහන් අංගයන් කෙරෙහි ඔබගේ අවධානය යොමු කරන ලෙස දන්වා සිටිමි.

<u>ආයතන පරිශ්‍ර සූදානම් කිරීම</u>

මෙහිදී මූලික අදියර ලෙස කසළ වෙන් කිරීමේ සම්මත වර්ණවලින් සමන්විත කසළ බඳුන් ස්ථාන ගත කළ යුතු ආකාරය පිළිබඳව සැලසුම් සකස් කළ යුතු ය. අවශ්‍ය කසළ බඳුන් ප්‍රමාණය හා ඒ ඒ ස්ථානයට ගැලපෙන ආකාරයේ බඳුන් භාවිතා කිරීම මෙම ක්‍රමවේදය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා බෙහෙවින් බලපානු ඇත. කසළ බඳුන් තබා ඇති ස්ථානවල කසළ වෙන් කිරීමේ වැදගත්කම හා කසළ වෙන් කරන ආකාරය පිළිබඳ දැනුවත් කිරීමේ පුවරු ප්‍රදර්ශනය කිරීම ආදී වශයෙන් පූර්ව වශයෙන් ආයතනයේ කාර්යය මණ්ඩලය කසළ වෙන් කොට බැහැර කිරීම සඳහා සූදානම් කළ යුතු ය.

<u>දැනුවත් කිරීම</u>

කසළ වෙන් කිරීම හා කසළ බැහැර කිරීම පිළිබඳව මනා පුහුණුවක් පවිත්‍රතා අංශයේ සේවක සේවිකාවන් වෙත ලබා දීම අත්‍යාවශ්‍ය ය. ඒ සඳහා ප්‍රායෝගික ලෙස ඔවුන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා නිසි ලෙස ඔවුනට පුහුණුවක් මෙන්ම ආකල්පමය වෙනසක් ද ඇති කරලීමේ වැඩසටහනක් පැවැත්විය යුතු ය. ඉන් පසු කසළ වෙන් කොට බැහැර කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩපිළවෙළ සම්බන්ධයෙන් ආයතනයේ සියලු නිලධාරීන් දැනුවත් කළ යුතු ය. එහිදී වර්තමානය වන විට උද්ගත වී ඇති ගැටළු, එයින් ඇතිවන පාරිසරික හානිය, කසළ වෙන් කිරීමේ වැදගත්කම, කසළ වෙන් කිරීමේ සම්මත වර්ණ සහ කසළ වෙන් කළ යුතු ආකාරය ආදී කරුණු ආවරණය වන පරිදි කාර්යය මණ්ඩලය දැනුවත් කළ යුතු ය.

**<u>කසළ වෙන් කිරීම අධීක්ෂණය</u>**

කසළ වෙන් කොට බැහැර කිරීම අධීක්ෂණය සඳහා එක් අංශයකින් එක් නිලධාරියෙකු පත් කොට සම්බන්ධීකරණ කටයුතු පුදුකිරීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීමටත් මෙම ක්‍රමවේදය නිසි පරිදි ක්‍රියාත්මක වන්නේ දැයි අධීක්ෂණය කිරීමට හා මාසිකව රැස්වීම් පවත්වා මෙහි ප්‍රගතිය පිළිබඳ සොයා බැලීමටත් කටයුතු කළ යුතු ය.

04. දෙපාර්තමේන්තු මූලස්ථානය / බලකා මූලස්ථාන / පුහුණු පාසල් පරිශ්‍රවල කසළ නිසිපරිදි බැහැර කිරීම තුළින් පරිසරය සුරැකීම සඳහා ඔබගෙන් ලැබෙන සහයෝගය බෙහෙවින් අගය කොට සලකන අතර කසළ කළමනාකරණ වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක විය යුතු බවත් මින් දන්වා සිටිමි. එසේම රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 24/2016 (ඇමුණුම 01) අනුව ද මෙම වැඩසටහන යාවත්කාලීන විය යුතු බව වැඩිදුරටත් දන්වා සිටිමි.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
නො: 23, දුම්රියපොළ පාර,
බම්බලපිටිය, කොළඹ-04.

පිටපත -
1. ජනාධිපති ලේකම් - ඔබගේ අංක PCMD/PS/02/PCG හා 2017.01.03 වන දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.
2. ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය - කරු.දැ.ගැ.ස.

ඇමුණුම 01

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 24/2016

මගේ අංකය : MPA/IAD/ADM/GA01/චක්‍රලේඛ
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.
2016-10-20

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>පොලිතින්, ප්ලාස්ටික් හා විද්‍යුත් අපද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩසටහන -2016</u>**

ජනාධිපති ලේකම් කාර්යාලයේ අංක PS/DSP/ENV-U/WST-MGNT හා 2016-10-19 දිනැති ලිපිය හා බැඳේ.

02. පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික උපාංග භාවිතය දිනෙන් දින ඉහළ ගොස් ඇති අතර දිනපතා භාවිතයෙන් ඉවත් කරනු ලබන පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය අවිධිමත් ලෙස බැහැර කිරීම හේතුකොට ගෙන විවිධ පාරිසරික, සෞඛ්‍යමය හා ආර්ථික ගැටලු වලට මුහුණ දීමට ජනතාවට සිදු වී ඇත. මෙම ගැටලුවට විසඳුමක් ලෙස පොලිතින්, ප්ලාස්ටික් හා ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය එක්රැස් කිරීම හා විධිමත්ව බැහැර කිරීම සඳහා "පොලිතින්, ප්ලාස්ටික් හා විද්‍යුත් අපද්‍රව්‍ය නිවාරණ ජාතික වැඩ සටහන" 2016-10-24 සිට 2016-10-30 දක්වා පැවැත්වීමට මධ්‍යම පරිසර අධිකාරිය විසින් සැලසුම් කර ඇත.

03. ඒ අනුව දිප ව්‍යාප්තව පැවැත්වෙන මෙම ජාතික වැඩ සටහනට සමගාමීව සියලුම රාජ්‍ය ආයතන තුල අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් පහත ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

- සියලු රාජ්‍ය ආයතන තුල හා ඉන් පිටත ද පොලිතින් හා ප්ලාස්ටික් අපද්‍රව්‍ය ඇතුළුව ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- අපද්‍රව්‍ය ජනනය වන ස්ථානයේදීම නිසිපරිදි වෙන්කර බැහැර කිරීමට කටයුතු කිරීම.
- අපද්‍රව්‍ය බහාලීම සඳහා සම්මත වර්ණ රටා සහිත කසල බඳුන් ස්ථාපනය කිරීම.
- ආයතනය තුළ පොලිතින් භාවිතය අවම කිරීම, පොලිතින් කෑම දවටන වෙනුවට පරිසර හිතකාමී ඇසුරුම් භාවිතය ප්‍රචලිත කිරීම සහ ආපන ශාලාවල පොලිතින් කෑම දවටන භාවිතය නතර කිරීමට උපදෙස් දීම.
- ආයතනය තුළ ඉහත ක්‍රියාමාර්ග නිසි අධීක්ෂණයක් යටතේ අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට කටයුතු කිරීම.

04. පාරිසරික හා සෞඛ්‍යමය ගැටලුවලින් තොරව රාජ්‍ය ආයතන පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩසටහන් ඉදිරියටත් ක්‍රියාත්මක කිරීමට මූලිකත්වය ගෙන කටයුතු කරන ලෙස ද කාරුණිකව දන්වමි.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

පිටපත් :

1. ජනාධිපති ලේකම් - ඔබගේ අංක PS/DSP/ENV-U/WST-MGNT හා 2016-10-19 දිනැති ලිපිය අනුව කරු.දැ.ගැ.ස.